(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 188.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 අගෝස්තු මස 10 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

67/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කෘෂිකර්මාන්තය සඳහා කෘෂි රසායන හා පොහොර භාවිතා කිරීම සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන පරිසර විනාශය නිසා ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර අපවිත්‍ර වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ජනතාවගේ පරිභෝජනයට නුසුදුසු ජලය සහිත ගංගා, වැව් හා අනෙකුත් ජල මූලාශ්‍ර පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එසේ නම්, ජලය දූෂණය වී ඇති ප්‍රධාන ජල මූලාශ්‍ර කවරේද;

(iii) එම ස්ථාන පරිභෝජනයට සුදුසු පරිදි පිරිසිදු කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ඉදිරි කාලයේදී ජල මූලාශ්‍ර අපවිත්‍ර වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1072/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුදල් අමාත්‍යාංශය විසින් බදු ගෙවීම පිළිබඳව 2016 සැප්තැම්බර් මාසයේදී මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචාරය කරනු ලැබූ දැන්වීම් ප්‍රචාරය කිරීම ආරම්භ කළ දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත දැන්වීම,

(i) ප්‍රචාරය නැවැත්වූ දිනය කවරේද;

(ii) ප්‍රචාරය කිරීම සඳහා එක් එක් මාධ්‍ය ආයතනයට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් සහ සමස්තයක් වශයෙන් කොපමණද;

(iii) පළකිරීම සඳහා වෙන් කළ මුදල මාධ්‍ය ආයතන අතර බෙදීමට යොදා ගත් පදනම කවරේද;

(iv) පළකිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා දුන් රාජ්‍ය ආයතන සහ එක් එක් ආයතනය විසින් දක්වන ලද දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) පළකිරීම සඳහා අමාත්‍යාංශ මුදල් වැය කලේ නම්, ඒ සඳහා යොදා ගත් වැය ශීර්ෂ කවරේද;

(vi) පළ කිරීමට යොදා ගත් දැන්වීම් නියෝජිතායතන සහ එක් එක් ආයතනයට ලබා දුන් කොමිස් සහ ගාස්තු මුදල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එකී ප්‍රචාරක නියෝජිතායතන තෝරා ගත් පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1120/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ, පළාත් මහජන පෙත්සම් කාරක සභාවක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම පළාත් මහජන පෙත්සම් කාරක සභාවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා බලයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා එම කාරක සභාවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) මේ දක්වා අදාළ ගැටලු විභාග කර සහන ලබා දී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) මෙම කාරක සභාව මඟින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කර ඇති හා ක්‍රියාත්මක නොකර ඇති පළාත් රාජ්‍ය ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකරන පළාත් රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ගැනීමට බලාපොරොත්තු වන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1196/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට යාපනය දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1305/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ වාර්තා වී ඇති බල අපරාධ සංඛ්‍යාව, එක් එක් පොලිස් ස්ථානය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් බල අපරාධ සංඛ්‍යාව, අපරාධයෙහි ස්වභාවය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් බල අපරාධවල චූදිතයන්ට එරෙහිව ගෙන ඇති නීතිමය පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අපරාධ වාර්තාකරණයේදී අනුගමනය කළ යුතු මාධ්‍ය ඇවතුම් පැවතුම් පිළිබඳ යම් ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) සෑම පාර්ශ්වයකටම එකඟ විය හැකි ආචාර ධර්ම පද්ධතියක් සැකසීම සඳහා පියවර ගන්නේද;

(iii) ඉකුත් පාලන සමය හා වත්මන් පාලන සමය තුළ සිදුවී ඇති අපරාධවල ප්‍රමාණය හා ස්වභාවය සළකා බැලීමේදී පැවති හෝ පවතින පාලනය සමඟ සබඳතාවක් තිබේ යැයි විශ්වාස කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1411/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 179 යෝජනාවට අනුව, ආනයනය කරනු ලැබූ ස්වර්ණාභරණ සඳහා පැනවූ 10%ක සෙස් බද්ද මඟින් රැස්කළ මුළු බදු ආදායම කොපමණද;

(ii) එකී සෙස් බද්ද දේශීය ශිල්පීන් සුරැකීම සඳහා යොදාගත් ආකාරය කවරේද;

(iii) වර්ෂ 1977 සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ස්වර්ණාභරණවල වටිනාකම සහ ප්‍රධාන ආනයනකරුවන් 20 දෙනාගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ශ්‍රී ලංකාවට ස්වර්ණාභරණ ආනයනය කරන්නේ නම්, ඒවායේ ප්‍රධාන සැපයුම්කරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1496/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා එක් එක් වර්ෂයේදී උතුර, නැගෙනහිර, ඌව හා උතුරුමැද පළාත් සභා සඳහා වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පළාත් සභා විසින් එක් එක් වර්ෂයේදී වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පළාත් සභා විසින් වියදම් කළ මුදල වෙන්කරන ලද මුදලේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1544/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුරයේ පදිංචි, තිදරු මවක් වන සුජානි නමැති කාන්තාව කුවේට් රජයේ සේවයේ නියුතුව සිටියදී ඉතාමත් අමානුෂික අන්දමින් වද හිංසාවට ලක් වී ඇති බවත්;

(ii) එම අමානුෂික වද හිංසා හේතුවෙන් සුෂුම්නාවට දරුණු ලෙස හානි සිදුවී, ඇය කුවේට්හි අඩාන් රෝහලේ 17 වාට්ටුවේ ප්‍රතිකාර ගන්නා බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) සුෂුම්නාවට හානි සිදුවීම හේතුවෙන් එක්තැන් වී සිටින ඇය වහාම ශ්‍රී ලංකාවට ගෙන්වා ගත යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඇයට ලැබිය යුතු වන්දි මුදල්ද සමඟින් වහාම ලංකාවට ගෙන්වා ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1573/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලොන්නරුව, මනම්පිටිය වැලි අවශ්‍යතාවය අනුව නිකුත් කිරීම සිදු කරනු ලබන්නේ මනම්පිටිය වැලි සමාගම බව දන්නේද;

(ii) මෙම සමාගම රජයේ සමාගමක්ද; එසේ නොමැති නම්, අර්ධ හෝ පූර්ණ පුද්ගලික සමාගමක්ද;

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කවුරුන්ද;

(iv) අදාළ සමාගම විසින් ඉල්ලුම්කරුවන්ගේ අවශ්‍යතාව අනුව වැලි නිකුත් කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1592/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක ගොවිජන සේවා මධ්‍යස්ථාන බලප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලප්‍රදේශ පිහිටි මධ්‍යස්ථානවල නම් කවරේද;

(iii) එම එක් එක් බලප්‍රදේශයෙන් පොහොර සහනාධාරය සඳහා ඉල්ලුම් කර ඇති ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ගොවීන් අතරින් පොහොර සහනාධාර මුදල් ලබාගත් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(v) පොහොර සහනාධාර මුදල් ලබාදීමට නියමිත ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(vi) මෙතෙක් පොහොර සහනාධාර මුදල් නොලැබුණු ගොවීන් සඳහා මුදල් ලබාදීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1602/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇන්ටේ ලෙකෝ ප්‍රයිවට් ලිමිටඩ් (Ante Leco (pvt) Ltd.) ආයතනය පිළිබඳ රජයට ඇති අයිතිය කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කරන ලද අරමුණ කවරේද;

(iii) එම සමාගම විසින් නිෂ්පාදනය කර ඇති විදුලි මීටර් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භයේ සිට එම සමාගම ලබා ඇති ලාභය හෝ පාඩුව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1605/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,—විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකර ඇති බර ඉන්ධන (HFO) මඟින් දැනට ක්‍රියාත්මක වන බලාගාරය වසරක කාලයක් තුළ ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) මඟින් ක්‍රියාත්මක කරවීම සඳහා එකඟතාවයක් තිබුණේද;

(ii) එම එකඟතාවය කඩ වී තිබේද;

(iii) එම එකඟතාවය කඩවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති අලාභය කොපමණද;

(iv) එකී බලාගාරය මඟින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දෙන විදුලි ඒකකයක මිල නියම කිරීමට අදාළව ඇතිකර ගන්නා ලද එකඟතාවයන්ට පටහැනිව කටයුතු සිදුවන බව දන්නේද;

(v) ගිවිසුම් ප්‍රකාරව විදුලි සැපයුම්කාර සමාගම ක්‍රියා කිරීම තහවුරු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම එකඟතාවය පරිදි කටයුතු නොකිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1611/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ, වලව කලාපයට අයත් ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉන් ජනතාව සඳහා බෙදා දී ඇති ඉඩම් ප්‍රමාණය, එක් එක් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අක්කර 50ට වැඩි ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඉඩම් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(iv) ඉහත (iii) හි සඳහන් ඉඩම් කැබිනට් අනුමතියක් මත ලබා දුන්නේද;

(v) නොඑසේ නම්, එම ඉඩම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1626/'17

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තඹුත්තේගම රෝහල, උතුරු මැද පළාත් සභාවට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මූලික රෝහල්වලින් එක් රෝහලක් බව දන්නේද;

(ii) එසේ නම්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තඹුත්තේගම, ගල්නෑව රාජාංගනය, තලාව, ඉපලෝගම සහ නොච්චියාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ වයඹ පළාතේ මහව, ගල්ගමුව සහ මීගලෑව යන ප්‍රදේශවල රෝගීන් මෙම රෝහලෙන් ප්‍රතිකාර ලබා ගන්නා බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම රෝහලේ පළමු වාට්ටුවේ/හදිසි අනතුරු වාට්ටුවේ සාමාන්‍යයෙන් දිනකට නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වාට්ටුවේ ඇති ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝගීන් සඳහා ලබා දී ඇති පහසුකම් පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iv) මෙම රෝහල සඳහා පසුගිය වර්ෂයේ නව වාට්ටු සංකීර්ණයක් ඉදිකර ඇති බව දන්නේද;

(v) මේ වනතෙක් එහි වැඩ අවසන් නොකිරීමට හේතුව කවරේද;

(vi) නව ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කර එය විවෘත කිරීමට මැදිහත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1627/'17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2050 දී ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවයෙන් 100%ක්ම, සූර්ය බලය, සුළං බලය ඇතුළු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර මඟින් ලබා ගන්නා බවට ජාතික පුවත්පත්වල පළවූ වාර්තා නිවැරදිද;

(ii) එසේ නම්, එම අරමුණ ජාතික බලශක්ති ප්‍රතිපත්තියට කොතරම් දුරට එකඟ වන්නේද;

(iii) එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ඔබ අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇති කාර්යයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2016.03.08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතු ය. පූ. භා. 11.30 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උද්දර්පන පනත යටතේ නියමය (අංක 1),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර උද්දර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 07 දිනැති අංක 2022/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උද්දීපන පනත යටතේ නියමය (අංක 2),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්දීපන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුක්රේනය අතර උද්දීපන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 02 දිනැති අංක 2021/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 31 දිනැති අංක 2021/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝගය,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 මැයි 05 දිනැති 2017/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

දේශීය ආදායම් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.26 දින සලකා බලන ලදී.)

*12.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.03.07 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.24 දින සලකා බලන ලදී.)

*13.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.05.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.26 දින සලකා බලන ලදී.)

*14.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2011),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.12.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*15.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*16.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*17.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*18.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස කුරුණෑගල වැව්ලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස කුරුණෑගල වැව්ලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*19.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*20.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.07.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*21.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.08.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*22.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*23.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*27.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

28.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---